සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

**5519**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 ශ්‍රේණිය | චිත්‍ර කලාව - I | කාලය / நேரம் / Time | පැය 1 යි |
|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

**සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන 1 සිට 5 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.**



1. පොළොන්නරුව දළදා මළුවට ඇතුළු වූ විට වම්පසින් දක්නට ලැබෙන මෙම ගොඩනැගිල්ල ........................................................ නමින් හඳුන්වයි.
2. ගල් පොත සෙල්ලිපියට අනුව මෙය ........................................................ රජතුමාගේ නිර්මාණයකි.
3. මෙහි උතුරු දොරටුවේ පොළොන්නරු යුගයට අයත් කලාත්මක සඳකඩ පහණ හා ................................ දක්නට ලැබේ.
4. පොළොන්නරු යුගයට අයත් සුවිශේෂ බුද්ධ ප්‍රතිමා වන මෙවාහි චීවරයේ රැළි ..................................... වේ.
5. මෙහි සළපතල මළු දෙකක් වන අතර ඇතුළු මළුව වටා ගල් බැම්ම පෙති හතරේ අලංකාර ................................................ මල් රටාවකින් යුක්තය.

- **අංක 6 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

6. දැවයෙන් නිමවා රන් හා ඇත් දළින් ආවරණය කරන ලද ප්‍රතාපවත්, රණශූර, එඩිතර හා කාන්තා සුන්දරත්වයෙන් යුතු ග්‍රීක මූර්තිය කුමක් ද? ........................................................
7. සාංචි උතුරු තොරණේ දක්නට ලැබෙන ඇතුන්ගේ ස්වභාවික ඉරියව් ගති ලක්ෂණ හා චලනයන්ගෙන් යුතු ජාතක කථාව කුමක් ද? ........................................................

8. රෆායෙල් සැන්ටි විසින් අඳින ලද පැරණි ග්‍රීක දාර්ශනිකයන්, වාද විවාදවල පැටලී සිටින අයුරු පෙන්නුම් කරන සිතුවම නම් කරන්න. ..........................................................................................

9. පරාල 26 ක් එක ලී ඇණයකට සම්බන්ධ කර ඇම්බැක්කේ දේවාලයේ නිර්මාණය කර ඇති පියස්ස හඳුන්වන්න

..........................................................................................

10. ඝනකවාදී කලාවේ ලක්ෂණ අනාවරණය කරගනිමින් දුඹුරු වර්ණය ප්‍රමුඛ වන වර්ණිත වර්ණ මාලාවක් යොදාගෙන කුතුල් [illegible] නම් සිතුවම නිර්මාණය කළ ශිල්පියා කවුද? ..........................................................................................

- අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට යටින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය නම් සිතුවම දක්නට ලැබෙන ස්ථානය වන්නේ,
    1. ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ ය.
    2. සාන්තා මරියා ඩෙලා ග්‍රේසි නැමැති ඩොමිනිකානු කන්‍යාරාමයේ ය.
    3. රෝමයේ ශාන්ත පීතර් දේවමැදුරේය.
    4. රෝමයේ ස්ටැන්සා ඩෙලා සිග්නතූරා නැමැති ගොඩනැගිල්ලේය.

12. ගඩලාදෙණිය විහාරයේ ගෘහ නිර්මාණ ශිල්පියා ලෙස සඳහන් කරන ලද්දේ,
    1. ස්ථපතිරායර්
    2. ගණේෂ්වරාචාරිය
    3. සේනාධිලංකාර
    4. දෙල්මඩ මූලාචාරිය

13. තන්තිරිමලේ බුද්ධ ප්‍රතිමාවේ දකුණතින් දක්වෙන මුද්‍රාව වනුයේ,
    1. සමාධි මුද්‍රාව
    2. කටකහස්ත මුද්‍රාව
    3. විතර්ක මුද්‍රාව
    4. අභය මුද්‍රාව

14. තරල ආකෘති හැඩවලට අයත් මිනිස් නිර්මාණයේ පුරෝගාමී ශිල්පියා මෙන්ම නිර්මාණශීලී සන්නිවේදනය චිත්‍ර ශිල්පියෙක් වන්නේ,
    1. තුමන දිසානායක
    2. ජී.එස්. ප්‍රනාන්දු
    3. ස්ටැන්ලි අබේසිංහ
    4. ඩබ්.ආර්. විජේසෝම

15. කාටූන් ශිල්පියකු වන ජෝර්ජ් ලූකස් විසින් නිර්මාණය කරන ලද ප්‍රමිල කාටූන් චරිතය වන්නේ,
    1. පුංචි සිඤ්ඤෝ
    2. අප්පුහාමි
    3. මයිකල් මච්චාන්
    4. ගජමෑන්

- අංක 16 සිට 20 තෙක් දී වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය මගින් ලියන්න.

16. සිරිගල් ..........................................................................................

..........................................................................................

17. [illegible] ..........................................................................................

..........................................................................................

18. සකපෝරුව ..........................................................................................

..........................................................................................

19. කෝලම් රඟ ..........................................................................................


..........................................................................................

20. ස්තූපිකා ..........................................................................................

..........................................................................................

• අංක 21 සිට 25 තෙක් රූප සටහන්වල කිසියම් සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියෙන් ඇති A, B, C, D, සහ E යන ඒවා අතුරින් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.


21.  (.............)

22.  (.............)

23.  (.............)

24.  (.............)

25.  (.............)

A 

B 

C 

D 

E 

• අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

26. කාන්තාවන් නව දෙනෙකුගෙන් ඇතෙකු ආකාරයට නිර්මාණය වූ සිතුවම .................................... නමින් හැඳින්වේ.

27. මහනුවර දුම්බර ප්‍රදේශයේ ප්‍රසිද්ධියක් උසුලන කලාල පැදුරු සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස ............................ ශාකයේ පත්‍රවලින් ලබා ගන්නා ලද කෙඳි භාවිතා කෙරේ.

28. ඉන්දියාවේ අජන්තා ලෙන් පන්තියේ දක්නට ලැබෙන සිතුවම් අතර අප්සරා රූප අංක ........................ ලෙනෙහි දක්නට ලැබේ.

29. ඉන්දුනිම්න වැසියන් ලෝහ වාත්තු කිරීමේ තාක්ෂණයෙන් පරිනත ව සිටි බවට ................................ මූර්තියෙන් පැහැදිලි වේ.

30. දියසායම් චිත්‍ර නිර්මාණයේ දී වර්ණයක පැහැය අඩුකර ගැනීම සඳහා එම වර්ණයට ............................. එකතු කරනු ලැබේ.

• **අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, සහ J යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.**


F


G


H


I


J

31. F අක්ෂරයෙන් දැක්වෙන දළදා මාළිගාවේ සුවිශේෂී ම ගෘහ නිර්මාණ අංගය කුමක් ද? ..............................

32. G අක්ෂරයෙන් දැක්වෙන ඇතා වල්ලිව එලවාගෙන යෑම නම් චිත්‍රය නිර්මාණය කළ ශිල්පියා කවුද?

..................................................

33. H අක්ෂරයෙන් දැක්වෙන සීගිරි අප්සරා රූ තුළින් කුමන චිත්‍ර කලා සම්ප්‍රදායක් පිළිබිඹු වේ ද?

..................................................


34. I අක්ෂරයෙන් දැක්වෙන දෙගල්දොරුව විහාරයේ ඇලි ඇතුන් දන්දීම සිතුවම නිර්මාණ කළ ශිල්පියා කවුද?

..................................................

35. J අක්ෂරයෙන් දැක්වෙන යහපත් සමතාරිනුවරයා නම් සිතුවම දක්නට ලැබෙන ස්ථානය කුමක් ද?

..................................................

• **පහත දැක්වෙන චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උපමාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය 5 ක් ලියන්න. (තනි වචනයෙන් සපයන පිළිතුරු සඳහා ලකුණු නොලැබේ.)**



36. ශිල්පියා ..................................................

37. තේමාව ..................................................

38. සංරචනය ..................................................

39. වර්ණ භාවිතය ..................................................

40. ප්‍රකාශිත හැඟීම ..................................................


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න